# පුරාණ මැණික්කඩවර ටැම්පිට විහාරයේසිතුවම්වල පෘතුගීසි බලපෑම් පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යනයක්


අයි.කේ.එස්. තිලකරත්න

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය,ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
sanjeewanit@gmail.com



ප්‍රමුඛ පද: පෘතුගීසි, සිතුවම්,ටැම්පිට විහාරය


### හැඳින්වීම

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, වරකාපොළ උප දිසාපති කොට්ඨාසයේ නැතහොත් සතර කෝරළයට අයත් බෙළිගල් කෝරළයේ, කීරවැලි පත්තුව නැගෙනහිර කොටසේ මැණික්කඩවර ග්‍රාමසේවා වසමට අයත්ව මැණික්කඩවර පුරාණ ටැම්පිට විහාරය පිහිටා ඇත.මෙම විහාරයෙහි ඉතිහාසගත තොරතුරු විමසා බැලීමේ දී දීර්ඝ ඉතිහාසයක් ලිබිතවම හමුවන ප්‍රදේශයක් ලෙස මැණික්කඩවර ග්‍රාමය හැඳින්විය හැකිය.පොළොන්නරු අවධියේ රජකල මහා පරාක්‍රමබාහු රජුගේ ජන්මභූමිය ද මැණික්කඩවරට ආසන්න දැදිගමයි.එතුමාගේ පියා වන මානාභරණ දැදිගම ප්‍රදේශයේ ප්‍රාදේශීය පාලකයෙකු වශයෙන් සිටි බව පැවසේ. එබැවින් මේ ප්‍රදේශය ඊට ප්‍රථම සිට ජනාවාසව පවතින්නට ඇති නිසා ආගමික ස්ථාන ඉදි වී තිබීම සාමාන්‍ය සිදුවීමකි.විහාර භූමිය තුළ රෝපණය කර ඇති බෝධිය තිසර සන්දේශ කතුවරයා දක්වන ආකාරයට කෝට්ටේ රාජධානි සමයට පෙර පැවති බවට දක්වා ඇත.මෙම ටැම්පිට විහාරය පුරාවිද්‍යාත්මක, ඓතිහාසික, කලාත්මක යන අංශ ඉතා වැදගත් ස්ථානයකි.දැනට විහාරස්ථානයේ ඇති පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් ස්මාරකයක් වන ටැම්පිට විහාරය කවුරුන් විසින් ඉදිකරන ලද්දක් දැයි පැහැදිළි තොරතුරු නැත.එහෙත් මෙම ටැම්පිට විහාර ක්‍රමය ප්‍රචලිතව පැවතියේ මහනුවර යුගයේ දී ය.විහාරයේ ඇති බිතු සිතුවම් මහනුවර යුගයේ සිතුවම්වලට සමාන වීමත් ඒ සිතුවම්වල යම් යම් පෘතුගීසි බලපෑම් ලක්ෂණ දක්නට තිබීමත් නිසා පෘතුගීසින්ගේ පැමිණීමෙන් පසුව කරන ලද්දක් බව පෙනී යයි.ඒ අනුව මෙම ටැම්පිට විහාරය සතුව පවතින සිතුවම් හා එහි පෘතුගීසි බලපෑම පිළිබඳ ව අධ්‍යන කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ.

### ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා ක්ෂේත්‍ර සහ ක්ෂේත්‍ර නොවන ගවේෂණය යන ක්‍රමවේද භාවිත කරන ලදි.සිතුවම් අධ්‍යයනයන් සඳහා සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය කරන ලදි.ප්‍රාථමික මූලාශ්‍රයක් ලෙස දැදිගම පුරාණය අධ්‍යයනය ද මීට අමතරව සිංහලේ පුරාණ ඇඳුම් ආයිත්තම් යන මූලාශ්‍ර මූලික වශයෙන් පරිශීලනය කරන ලැබීය.මීට අමතරව අන්තර්ජාල මූලාශ්‍ර ඇසුරින් ද මෙම පර්යේෂණය සඳහා තොරතුරු එක් රැස් කරගන්නා ලද අතර ක්ෂේත්‍ර ගවේෂණය ඔස්සේ විහාර සිතුවම් නිරීක්ෂණය කිරීමත් සිදු කරන ලදි.

### ප්‍රතිඵල හා සාකාච්ඡාව

මහනුවර යුගයේ හා ඊට පෙර පහතරට එනම් කෝට්ටේ, කොළඹ ආදි ප්‍රදේශවල

සිට උඩරටට යන ප්‍රධාන මාර්ගය වැටී තිබුණේ ද මැණික්කඩවර ඔස්සේය.එම මාර්ගයේ පිහිටි ප්‍රධාන පෘතුගාල් බලකොටුව වූයේ මැණික්කඩවරයි.මෙම බලකොටුවට ඉතාමත් සමීපයෙන් මෙම විහාරස්ථානය පිහිටා තිබේ. පෘතුගීසින්ගේ ආගමනය හේතුවෙන් එම ප්‍රදේශය ආශ්‍රිතව නිරන්තර සබඳතාවන්හි ප්‍රතිඵලයක් මත දේශීය මුල් පදිංචිකරුවන් හා කලාකරුවන් හට ද එම ආභාසය යම්තාක් දුරට ලැබුණු ආකාරයක් හඳුනාගත හැකි ය.එහි එක් ප්‍රතිඵලයක් ලෙස මැණික්කඩවර ටැම්පිට විහාරය සතු සිතුවම් දක්නට ලැබේ.මෙය ද අනෙකුත් ටැම්පිට විහාර මෙන් ගල් කණු මත නිර්මාණය කර ඇති අතර විහාර ගෘහය තරමක් විශාලය.එය කොටස් දෙකකින් යුක්ත වේ. ඇතුල් ගෘහය හා ප්‍රදක්ෂිණා පථය වශයෙනි.පිටත ගෘහයේ දොරටුව සහිත බිත්තියේ හැර ඉතිරි බිත්ති තුනෙහිම අඛණ්ඩ තනි පනේලයක් ලෙස මෙම කොටසේ චිත්‍ර ඇඳ තිබේ.බිත්ති තුනෙහිම ඇති මෙම පනේලයේ සිතුවම් කර ඇත්තේ ධර්මපාල ජාතකය යි.කතාව ආරම්භ වන්නේ දකුණු බිත්තියෙනි.

මුලින් ම ඇත්තේ ගෘහයක සිතුවමකි.ගෘහය කොටස් තුනකට පෙන්වා ඇත.පළමු කුටියේ යුවලක් යම් සාකච්ඡාවකට නිරතවන අයුරු දක්වයි.මෙහි පවතින විශේෂත්වය වන්නේ මෙම පුද්ගල චරිතයන්වල දක්නට ලැබෙන ඇඳුම් හා පැළඳුම්වල රේන්ද මෝසතර දක්නට ලැබේ.ඊට අමතරව අනිකුත් විහාර සිතුවම්වල දක්නට නොලැබන කර තෙක් වැසී ගිය උඩුකය ඇඳුම සහ කර වටා පැවති මන්තයකින් ද, පෘතුගීසි විනිසුරුන්ගේ ඇඳුම්වලට සමාන ස්වභාවයක් දක්නට ලැබේ.ස්ත්‍රියගේ උඩුකය වසා ඇති සරුවාලයකිනි.පෘතුගීසි ස්ත්‍රීන්ගේ ඇඳුම් සහ යොදාගත් අමතර විලාසිතා රෝමානු කතෝලික පල්ලිවල උත්සවවලදී දැකිය හැකි ස්ත්‍රීන්ගේ මුහුණු ආවරණය ද (veil) මෙම සිතුවම්වල මංගල උත්සවය අවස්ථාවේ දී ඇඳ ඇති ඇඳුම්වලට සමානය.රාජකීය ඇඳුමේ පෘතුගීසි බලපෑම දැකිය හැක්කේ රන් හෝ රිදී කොළරය, පටිය,පසුම්බිය සහ ඇවිදීමට යොදා ගනු ලබන සැරයැටියෙනි.එමෙන්ම මෙහි පෘතුගීසි ආභාසය සහිත යතුරු ලා තැබිය හැකි මංජුසාවක් දක්නට ලැබීමයි.සිතුවම් අතර වහලයෙහි එල්ලන ලද අලංකාරාත්මක ලාම්පුවක් දක්නට ලැබේ.එහි පෘතුගිසි සැරසිලිවලින් යුක්ත වීම විශේෂත්වයකි.ඔටුන්නක් පැළඳි සිටි පුද්ගලයා රජු ලෙස සැලකීමේ දී අනෙකුත් පුද්ගලයන්ගේ ඇඳුම් පැළඳුම්වලට වඩා බොහෝ සෙයින් වෙනස්ය.ඒවායෙහි තිත් රටා සහිත මෝස්තරවලින් යුක්ත වේ.වැලමිට තෙක් වූ උඩුකය අත් සහ වැලමිට අභියස රේන්දයක් දක්නට ලැබේ.එමඟින් උසස් බවක් පෙන්නුම් කරයි.මෙම සිතුවම්වලට අනුව සාමාන්‍ය ජනයාගේ ඇඳුම් පැළඳුම්වලට පවා පෘතුගීසි ආභශය බලපා ඇති ආකාරයක් හඳුනා ගත හැකි ය.විශේෂයෙන් පෘතුගීසින් විසින් යටත් වැසියන් කතෝලික සමයට හැරවීමේ දී සහ බටහිර පන්නයට හැඩගැසීමේ දී පිරිමි පක්ෂය 'කරපුව' හෙවත් තොප්පියක් යොදා ගනු ලැබීය.ඒ අනුව මෙම සිතුවම්වලද තොප්පිය පැළද ගත් ජනයා දැක්වීමක් හඳුනාගත හැකි ය.සිව්වන කුටියේ මංගල උත්සවයක් නිරූපණය කරන අතර එහි පිරිමි දෙදෙනෙක් යම් සංග්‍රහයක් භුක්ති විඳින අයුරු පෙනේ.එක් අයෙකුගේ හිසෙහි රජුගේ යැයි සැලකෙන ඔටුන්නට සමාන නොවන හිස් පලඳනාවට බොහෝ සෙයින් සමානාත්වයකින් යුක්ත වේ.එක් අයෙකු වීදුරුවකින් යමක් බොන ආකාරයත් ඒ අසල ඇති තනි කණුවක් යෙදූ ටීපෝවක් වන බෝතලයක්, පිඟානක තැබූ මාලුවෙක්, පාන් ගෙඩියක් හා ගෑරුප්පුවක් සහ කුඩා පිහියක් ද දක්නට ලැබේ. මෙය අතිශයින් ම පෘතුගිසි ආභාසය පිළිඹිබු වන අවස්ථාවක් ලෙස පෙන්වාදිය හැකි

ය.ඊට අමතරව මෙම දර්ශණය මත්පැන් පානය කරන දර්ශනයක් ලෙස සැලකිය හැකිය.කාන්තා ආභරණ පිළිබඳ ව විමසමේ දී පෘතුගීසින්ගේ ආභරණවලට අනුව (හාරිච්චි) කටු යොදා ඇමිණිම,තෝඩු සහ බොත්තම් වැනි ආභරණ යොදා ගැනීමක් හඳුනාගත හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


අමරසිංහ, මාලිංග. (2000)***සිංහලේ පුරාණ ඇඳුම් ආයිත්තම්.***කොළඹ: ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.